ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2013 නොවැම්බර් 29 වැනි දින |

**2013 නොවැම්බර් මාසයේ දී උද්ධමනය සැලකිය යුතු ලෙස පහත වැටෙයි.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2006/2007=100) වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2012 අප්‍රේල් මාසයේ සිට වාර්තා වූ අවම මට්ටම කරා ළඟා වෙමින්, ලක්ෂ්‍යමය පදනම මත 2013 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 6.7 සිට 2013 නොවැම්බර් මාසයේ දී සියයට 5.6 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටිණි. ආහාර මෙන්ම ආහාර නොවන කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ යාමේ වේගය අඩු මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ධමනය තීව්‍ර ලෙස පහත වැටුණි. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය නොකඩවා හය වැනි මාසයටත් පහළ යමින් පූර්ව මාසයේ පැවති සියයට 7.6 හි සිට 2013 නොවැම්බර් මාසයේ දී සියයට 7.3 දක්වා අඩු විය.

මේ අතර, මිල මත වූ ඉල්ලුම් පීඩනය සාර්ථකව මැඩපැවැත්වීම පිළිබිඹු කරමින්, ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2007 වසරේ දී එය හඳුන්වා දෙනු ලැබීමෙන් අනතුරුව වාර්තා වූ අවම අගය වාර්තා කරමින් 2013 නොවැම්බර් මාසයේ දී සියයට 2.4 දක්වා තවදුරටත් පහත වැටිණි. මූලික උද්ධමනය අඩු මට්ටමක නොකඩවා පැවතීම, හිතකර උද්ධමන අපේක්ෂාවන් කෙරෙහි උපකාර වන මහ බැංකුවේ විචක්ෂණශීලී මුදල් කළමනාකරණයේ ප්‍රතිඵලයක් වන අතර, එය ආර්ථිකයෙහි මිල-වැටුප් දඟර හටගැනීම වලක්වාලීමට හේතු වේ. 2013 නොවැම්බර් මාසයේ දී වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද, සියයට 4.9 දක්වා තවදුරටත් පහත වැටිණි.




කො.පා.මි. දර්ශකයෙහි මාසික ඉහළ යාම, 2012 නොවැම්බර් මාසයේ වූ සියයට 1.3 ට සාපේක්ෂව 2013 නොවැම්බර් මාසයේ දී සියයට 0.2 ක පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. දර්ශකයෙහි සිදු වූ සුළු මාසික ඉහළ යාම සැලකීමේ දී ඇතැම් එළවළු වර්ග, අර්තාපල්, රතු ළූණු, ලොකු ළූණු, අමු මිරිස් සහ කිරිපිටිවල මිල ගණන් ඉහළ යාම ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩය සියයට 0.3 කින් ඉහළ නැංවීමට හේතු විය. කෙසේ වුවද, නැවුම් මත්ස්‍ය වර්ග, කරවල සහ පළතුරු මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ, ප්‍රවාහන (සියයට 0.5); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.2); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.1); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.1) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ ගියේය. 2013 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි බස් ගාස්තු ඉහළ නංවමින් සිදු කළ සංශෝධනය, ප්‍රවාහන උප කාණ්ඩයෙහි මිල ඉහළ නැංවීමට මුළුමනින්ම හේතු විය. මේ අතර, රෙදිපිළි හා පාවහන්; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සෞඛ්‍ය; සන්නිවේදන; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.